## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOME 4564 - බැංකු නීතිය හා පරිචය**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. " ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමයේ ප්‍රභවය හා වර්ධනය බොහෝ සෙයින්ම, බ්‍රිතාන්‍ය පාලන සමයේදී සිදුවූ අතර, ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු දේශීය ආර්ථිකයේ අවශ්‍යතා වලට ගැලපෙන පරිදි, ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමයේ වර්ධනය වීමක් පෙන්වයි. " විමසන්න.

(ලකුණු 20)

02. " ශ්‍රී ලංකාවේ බැංකු නීතියේ මූලාශ්‍ර බ්‍රිතාන්‍ය පාලන සමයේ සිටම අදාල ඉංග්‍රිසි නීතියේ අනුසාරයෙන් සකස් වී තිබේ. වර්තමානයේදී ඊට අමතරව, දේශීය ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන ලද අනපනත් ද, ශ්‍රී ලංකාවේ බැංකු නීතියේ මූලාශ්‍ර ලෙස වැදගත් වේ." සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. අ. චෙක්පත් පිටසන් කරන ආකාර සහ පිටසන් කිරීමේදී බලපාන රීති විස්තර කරන්න.

(ලකුණු 10)

ආ. චෙක්පත් රේඛනය කිරීමේ ප්‍රයෝජන සඳහන් කරමින් චෙක්පත් රේඛනය කරන ආකාර සහ අදාල රීති විස්තර කරන්න.

(ලකුණු 10)

04. " බැංකුකරු හා ගනුදෙනුකරු අතර පවතින්නේ ගිවිසුම් සබඳතාවයකි. මෙම ගිවිසුම් සබඳතාවය මත ඒ හා සබැඳි තවත් සබඳතා කීපයක් දෙපාර්ශවය අතර පැන නැගී ඇත. වඩා දුරට මෙම සබඳතාවය නිසා විශේෂ අයිතිවාසිකම් හා යුතුකම් ගණනාවක් දෙපාර්ශවය අතර හටගෙන තිබේ." සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. අ. " මීරිගම මහජන බැංකු ශාඛාවේ ජංගම ගිණුමක් හිමි බණ්ඩාර රුපියල් 3,000/- ක් සඳහා චෙක්පතක් සුනිල්ට නිකුත් කරයි. සුනිල් එම චෙක්පත වංචනික ලෙස රුපියල් 8,000/- ලෙසට වෙනස් කොට එය ආනන්දට ගනුදෙනු කරයි. ආනන්ද එම චෙක්පත

ලබාගත්තේ සද්භාවයෙන් හා ප්‍රතිෂ්ඨාවක් සඳහායි. ආනන්ද එම චෙක්පත ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කළ ද, ගෙවීම් කිරීමට ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති බව සඳහන් කරමින් බැංකුව එම චෙක්පත අගරු කරයි. " ඉහත පාර්ශවයන්ගේ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. බණ්ඩාර රු. 3,000/- ක් සඳහා චෙක්පත නිකුත් කර ඇත්තේ "ගණුදෙනු කළ නොහැකිය." යන රේඛනය සහිතව නම්, ඉහත පාර්ශවයන්ගේ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

06. රැස් කිරීමේ බැංකු කරු සහ ගෙවන බැංකු කරුගේ යුතුකම් සහ එම බැංකු කරුවනට ලබාගත හැකි ව්‍යවස්ථාපිත රැකවරණ පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 20)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

අ. ගනුදෙණු කළහැකි ලියවිලි

ආ. සමූපකාර ග්‍රාමීය බැංකු

ඇ. ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය.

(ලකුණු 10 බැගින් මුළු ලකුණු 20 යි)